Selectora

Install සහ Setup Guide

Install කිරීමේ සිට API key එක ගෙන පළවෙනි shoot එක කරනකම් කළ යුතු හැමදේම පිළිවෙළට.

Version	1.3.1
Mac	Selectora-1.3.1.pkg. Apple Silicon Mac (M1 හෝ අලුත්), macOS 15 හෝ අලුත්
Windows	Selectora-Setup-1.3.1.exe. Windows 10 හෝ 11 (64-bit). පිටු 10 බලන්න
Uninstall	Mac සහ Windows දෙකටම පිටු 11 බලන්න
Guide එක update කළේ	2026 නොවැම්බර් 6
Support	hello.velqoralabs@gmail.com

© 2026 VELQORA LABS

ආරම්භය

කළ යුතු දේවල් පිළිවෙළට

මේ පිළිවෙළටම කරන්න. මුළු වැඩේම එක පාරයි, ඊට පස්සේ shoot එක දාලා වැඩ කරන්න විතරයි.

#	කරන දේ	කොහෙන්ද
1	Selectora install කරන්න	Selectora-1.3.1.pkg file එක
2	Selectora activate කරන්න	App එක, VELQORA LABS email එක
3	Claude Console account එකක් හදන්න	platform.claude.com
4	AI credits දාන්න	platform.claude.com/settings/billing
5	API key එක හදන්න	platform.claude.com/settings/keys
6	Key එක Selectora එකේ දාන්න	App එකේ API key කොටස
7	පළවෙනි shoot එක කරන්න	App එක

ඕන කරන දේවල්

- **Mac එක:** M1, M2, M3, M4 හෝ අලුත් chip එකක් තියෙන Mac එකක්. Intel Mac වල වැඩ කරන්නේ නෑ.
- **macOS:** 15 (Sequoia) හෝ අලුත්. Apple menu > About This Mac එකෙන් බලන්න පුළුවන්.
- **Licence key එක:** Selectora ගත්ත වෙලාවේ WhatsApp එකෙන් ලැබෙනවා.
- **Email එකක්** සහ AI credits ගන්න **card එකක්.**
- **Internet:** AI sorting කරද්දී ඕන.

> **Windows computer එකක් නම්**
> Install කරන විදිහට පිටු 10 බලන්න. API key, credits සහ shoot එක කරන විදිහ Mac එකේ වගේමයි.

වචන තුනක තේරුම

API key	Selectora ට ඔයාගේ AI account එක පාවිච්චි කරන්න අවසර දෙන රහස් code එක. `sk-ant-` වලින් පටන් ගන්නවා.
Credits	AI වියදමට කලින් ගෙවලා දාන මුදල් (USD). **ගන්නේ මේවා.**
Tokens	AI එක වැඩ කරද්දී යන ප්‍රමාණය මනින ඒකකය. Tokens වෙනම ගන්න ඕන නෑ, පාවිච්චි වෙන ගාණට credits වලින් කැපෙනවා.

පියවර 1 සහ 2

Install සහ Activate

Install කරන විදිහ

1. Selectora open වෙලා තියෙනවා නම් quit කරන්න (**Cmd + Q**).
2. **Selectora-Mac-1.3.1.zip** එක double-click කරලා open කරන්න. ඒකේ **Selectora-1.3.1.pkg** file එක double-click කරන්න.
3. **Continue** ඔබලා, ඊට පස්සේ **Install** ඔබන්න. ඉල්ලුවොත් Mac password එක දෙන්න.
4. **Applications** folder එකෙන් Selectora open කරන්න.

> **"unidentified developer" වගේ message එකක් ආවොත්**
>
> Mac එක මේක block කළාට file එකේ වරදක් කියන එක නෙවෙයි, app එකට Apple certificate එකක් නැති නිසා එනවා. **Done** ඔබලා **System Settings > Privacy & Security** එකට ගිහින්, පහළට scroll කරලා **Open Anyway** ඔබන්න, Mac password එක දෙන්න.

Activate කරන විදිහ

1. App එක open කළාම Activation screen එක එනවා. ඔයාට ලැබුණු **Licence key** එක දාන්න (SEL-XXXX-XXXX-XXXX).
2. **Activate** ඔබන්න. Internet ඕන.

> **Package සහ devices**
>
> - එක licence එකක් එකවර devices **2කට** විතරයි.
> - 3වෙනි computer එකක activate කළොත්, දැනට තියෙන devices 2 පෙන්නනවා. එකක් තෝරලා **Sign out** කරන්න පුළුවන්.
> - Package: මාස 3, 6, 12 හෝ Lifetime. කාලය පටන් ගන්නේ පළවෙනි activation එකෙන්.
> - Internet නැතුව දවස් 7ක් වැඩ කරනවා. ඊට පස්සේ ටික වෙලාවකට internet එකට connect වෙන්න ඕන.
> - Package එක ඉවර වුණාම Activation screen එක එනවා. Renew කළාම ඒ key එකම දිගටම වැඩ කරනවා. Projects මැකෙන්නේ නෑ.
> - Mac එක මාරු කරනවා නම් **Login** එකෙන් **Sign out** කරන්න.

පියවර 3, 4 සහ 5

AI credits සහ API key එක ගන්න විදිහ

මේක කරන්නේ Anthropic සමාගමේ **Claude Console** website එකේ. එකම website එක: platform.claude.com

පියවර 3: Account එක හදන්න

1. Browser එකේ platform.claude.com එකට යන්න.
2. Email එකෙන් account එකක් හදන්න, නැත්නම් තියෙන account එකෙන් sign in වෙන්න.
3. Organization නමක් වගේ විස්තර ඉල්ලුවොත් ඔයාගේ නම හෝ business නම දාන්න.

පියවර 4: Credits දාන්න

1. platform.claude.com/settings/billing එකට යන්න.
2. **Buy credits** ඔබන්න.
3. මුදල දාලා card විස්තර දීලා confirm කරන්න. Credits ඒ වෙලාවෙම account එකට එනවා.

දැනගන්න

- මුලින් පොඩි මුදලක් දාලා, එක shoot එකකට කීයක් යනවද කියලා බලලා ඊට පස්සේ තව දාන්න.
- Credits ගත්ත දවසේ සිට **අවුරුද්දකින් expire** වෙනවා. **ආපහු ගෙවන්නේ නෑ** (non-refundable).
- claude.ai chat subscription එකයි මේ credits ටිකයි දෙකක්. Selectora වැඩ කරන්නේ Console account එකේ credits වලින්.

පියවර 5: API key එක හදන්න

1. platform.claude.com/settings/keys එකට යන්න.
2. **Create key** ඔබන්න.
3. මේ විදිහට තෝරන්න:

Name	`Selectora`
Expiration	**Never**. නැත්නම් ඒ කාලෙන් පස්සේ key එක නතර වෙනවා.
Linked account	ඔයාම (yourself)
Workspace	**Default**. මේක අනිවාර්යයි.

4. Key එක හැදුණාම **Copy** කරන්න. ඒ page එක වහන්න කලින් ඊළඟ පිටුවේ විදිහට Selectora එකේ දාන්න.

මේ දෙක අමතක කරන්න එපා


- **Workspace එක තෝරන්නම ඕන.** නැත්නම් key එක save වුණාට AI sorting fail වෙනවා.
- **Key එක පේන්නේ එක පාරයි.** නැති වුණොත් ආයෙත් බලන්න බෑ, අලුත් key එකක් හදන්න වෙනවා.

පියවර 6 සහ 7

Key එක දාලා පළවෙනි shoot එක

පියවර 6: Key එක Selectora එකේ දාන්න

1. Selectora එකේ Home එකේ **පටන් ගමු** ඔබන්න. මුල් පාරට tips ටිකක් ආවොත් **ඊළඟ** ඔබලා යන්න.
2. **Facebook Upload** හෝ **Album Creation** තෝරන්න. Album Creation නම් **Main Album** හෝ **Family Album** තෝරන්න.
3. **API key** කොටුවේ key එක paste කරලා **Save** ඔබන්න. මේක එක පාරයි, ඊළඟ පාර ඉඳන් අහන්නේ නෑ.




කොටුව 1: API key එක. **Key එක ගන්න** button එකෙන් key page එක කෙලින්ම open වෙනවා.

පියවර 7: පළවෙනි shoot එක

1. Shoot එකේ photos folder එක කොටුව 2ට drag කරන්න, නැත්නම් click කරලා තෝරන්න. JPG විතරක් දැම්මත් ඇති.
2. **Wedding, Homecoming, Engagement, Pre-shoot, Celebration** අතරින් shoot එක තෝරන්න. Wedding නම් ceremony එක (Poruwa, Church, Hindu, Muslim, Civil, Other) සහ Reception, Robe Shoot. Celebration නම් Birthday, Maternity, Anniversary වගේ වර්ගය. Pre-shoot නම් outfits ගාණ. ඕන photos ගාණ දීලා **Start** ඔබන්න. ඊට පස්සේ Selectora ම photos බලලා, shoot එකේ ඇත්තටම තියෙන sections වලට විතරක් බෙදනවා.
3. Desktop, Documents හෝ external drive එකට access ඉල්ලුවොත් **Allow** ඔබන්න.
4. AI එක බෙදලා ඉවර වුණාම sections බලලා, ඕන නම් tick වෙනස් කරලා **Save** කරන්න. අන්තිමේ AI වියදම USD වලින් පේනවා.

පාවිච්චිය

Photos බලන විදිහ සහ sections



Preview වෙන photo එක grid එකේ රතු පාටින්. Select වෙලා නම් ලොකු preview එක කහ පාට frame එකෙන්.

← →	කලින් / ඊළඟ photo එක
↑ ↓	Grid එකේ උඩ / පහළ photo එක
Select key (මුලින් Space)	එක පාරක් ඔබුවම select, ආයෙත් ඔබුවම deselect. Button එකේම key එක පේනවා.
Key එක වෙනස් කරන්න	**Select key** button එක ඔබලා අලුත් key එක ඔබන්න. Esc = නවත්තන්න.
Magnet	Mouse එක photos අතරේ ගෙනියද්දී රතු photo එක පැත්තට පොඩ්ඩක් ඇදෙනවා. ඕන නැත්නම් Preview එක යට tick එක අයින් කරන්න.

Section එකක් අඩු නම්

1. වම් පැත්තේ **Album sections** ළඟ **+** ඔබන්න (Setup screen එකේ **Section එකක් add කරන්න** එකෙනුත් පුළුවන්). නමයි photos ගාණයි දෙන්න.
2. Photos අතින් දානවා නම් photo එක right-click කරලා **Section එක වෙනස් කරන්න**. නැත්නම් **AI එකෙන් බෙදන්න** (credits යනවා).

> අලුත් section එකේ ගාණ album එකේ මුළු ගාණට එකතු වෙනවා. උදා: 250 + 10 = 260.

Section එකක් ගැළපෙන්නේ නැත්නම්

Section එක open කරලා උඩ **Hide** හෝ **මකන්න** ඔබන්න. **Hide:** වම් පැත්තේ **Hide කරපු sections** එකෙන් ආයෙත් ගන්න පුළුවන්, default save වෙන්නේ නෑ. Save screen එකේ tick එක දැම්මොත් විතරක් `Hidden – නම` folder එකට යනවා. **මකන්න:** photos Unsorted එකට යනවා.

පාවිච්චිය

Numbers, Family Album සහ versions

Numbers වලින් photos select කිරීම

1. උඩ **Numbers photo එකකින් scan කරලා select කරන්න** ඔබන්න.
2. Couple එක numbers ලියපු photo එක හෝ WhatsApp screenshot එක මෙතනට drag කරන්න, click කරලා තෝරන්න, නැත්නම් **Copy කරපු image එක** ඔබන්න. Numbers type කරන්නත් පුළුවන්.
3. කියවපු text එක පේනවා, වැරදි නම් හදන්න. **හම්බුණා** සහ **හම්බුණේ නැති** ගාණ බලලා **Select කරන්න** ඔබන්න.

> **හොයන විදිහ**
>
> - හොයන්නේ **import කරපු photos අතරින් විතරයි.** ඒකේ නැති number එක **හම්බුණේ නැති** ලැයිස්තුවට යනවා.
> - අකුරු එක්ක තියෙන number එකක් ඒ අකුරු එක්කමයි හොයන්නේ: IMG2516 කියලා DSC02516 ගන්නේ නෑ.
> - Search box එකත් එහෙමයි. 2516 කියලා type කළාම ඒ number එකම විතරයි.

Family Album

Album Creation > **Family Album** (නැත්නම් Main Album එකේ වම් පැත්තේ Family Album). මෙතන පේන්නේ family සහ guest group photos විතරයි, ඔක්කොම කහ පාටින් select වෙලා. Couple numbers දුන්නොත් **Scan** button එකෙන් හෝ **Couple දුන්න numbers දාන්න** එකෙන් දාන්න: එතකොට ඒ ටික විතරක් කහ පාටින් පේනවා, අනිත් family photos තියෙනවා. **Save** කළාම යන්නේ Family Album එක විතරයි, Main Album එක වෙනම save කරන්න.

AI තෝරන විදිහ

AI එක shoot එක දවසේ story එකක් විදිහට බලනවා. අඩුපාඩුවක් තියෙන photo එක (ඇස් පියවිලා, මුහුණ වැහිලා, වාහනෙන් අඩක් බැහැලා) **Weak frames** එකට ගිහින් ඒ මොහොතේ ඊළඟ frame එක ගන්නවා, හේතුව Preview එකේ පේනවා. Family එකේ ඇස් පියවීම fault එකක්, prayer එකක හෝ romantic photo එකක නෙවෙයි. Emotional photo එකක පොඩි අඩුපාඩුවක් තිබ්බොත් **Manual Review** එකට එනවා. හොඳම photos **Hero** එකේ. Photo කිසිවක් delete වෙන්නේ නෑ.

Versions

Project එකක් open කරලා වෙනසක් කරලා close කළාම ඒක **අලුත් version එකක්** විදිහට save වෙනවා, කලින් එක නැති වෙන්නේ නෑ. Home එකේ project එක ළඟ ⋯ ඔබලා පරණ version එකක් open කරන්න පුළුවන්. අන්තිම versions 20 තියාගන්නවා.

Project එකක් list එකෙන් මකන්න

Home එකේ project එක ළඟ ⋯ **> List එකෙන් මකන්න**. Project එකේ ticks Trash එකට යනවා. Original photos වලට අත තියන්නේ නෑ, photos folder එකේ **Selectora Project** folder එකෙන් ආයෙත් open කරන්න පුළුවන් (Selectora logo එක තියෙන file එක).

වියදම

AI වියදම සහ credits

Selectora package මිලට AI වියදම අයිති නෑ. ඒක යන්නේ API key එක අයිති කෙනාගේ Console account එකෙන්.

වියදම තීරණය වෙන්නේ

- Shoot එකේ photos ගාණ (ළඟ ළඟ එකම photos එකට ගන්න නිසා, AI එකට යන ගාණ අඩුයි).
- අන්තිමට ලොකුවට check කරන photos ගාණ.
- මුළු shoot එකම ආයෙත් AI එකෙන් බෙදනවා නම් (**AI ආයෙත් බෙදන්න**), ඒකට ආයෙත් වියදමක් යනවා.

Selectora පාවිච්චි කරන AI models සහ මිල

Model	වැඩේ	Input (tokens මිලියනයකට)	Output (tokens මිලියනයකට)
Claude Sonnet 5.5	Photos බෙදීම	USD 2	USD 10
Claude Opus 5.5	අන්තිම check එක	USD 4	USD 20

2026 නොවැම්බර් 4 වෙනිදා මිල. අලුත්ම මිල: claude.com/pricing

එක shoot එකකට කීයද?

Shoot එකෙන් shoot එකට වෙනස් වෙන නිසා ස්ථිර ගාණක් මෙතන දාලා නෑ. හොඳම ක්‍රමය: AI run එක ඉවර වුණාම Selectora එකේ පේන **"AI වියදම USD ... විතර"** ගාණ සටහන් කරගන්න. ඒක ආසන්න ගාණක්. ඇත්ත වියදම Billing page එකේ balance එකෙන් බලන්න.

Credits ඉවර වුණොත්

Balance එක ඉවර වුණාම AI sorting නතර වෙනවා, Selectora එකේ credit නැති බව පේනවා. Billing එකෙන් credits දාලා **Sort with AI** ආයෙත් ඔබන්න. Projects නැති වෙන්නේ නෑ.

Auto-reload (කැමති නම් විතරයි)

Balance එක අඩු වුණාම card එකෙන් ඉබේම credits ගන්න සැකසුමක්. Billing page එකේ **Set up auto-reload** ඔබලා, credits ගන්න ඕන balance එකයි, පුරවන්න ඕන balance එකයි දීලා **Turn on** ඔබන්න. නැවත නවත්තන්නේ **Manage auto-reload > Turn off**.

> **API key එක ආරක්ෂා කරගන්න**
>
> Key එක තියෙන කෙනාට ඔයාගේ credits වියදම් කරන්න පුළුවන්. Facebook, WhatsApp වල දාන්න එපා, කාටවත් දෙන්නත් එපා. Key එක කාටහරි ගියා කියලා හිතුණොත් keys page එකෙන් ඒක **Delete** කරලා අලුත් එකක් හදන්න.

උදව්

ප්‍රශ්න ආවොත්

පේන දේ	කරන්න ඕන දේ
"මේ API key එක Workspace එකකට හදලා නෑ"	අලුත් key එකක් හදලා Workspace එක **Default** තෝරන්න (පියවර 5). ඒ key එක Settings (Cmd + ,) එකේ දාන්න.
"API key එක වැරදියි"	Key එක expire වෙලා හෝ delete වෙලා වෙන්න පුළුවන්. අලුත් key එකක් හදලා Settings එකේ දාන්න.
"මේක API key එකක් වගේ නෑ"	මුළු key එකම copy වුණේ නෑ. `sk-ant-` වලින් පටන් ගන්න මුළු එකම copy කරන්න.
"Anthropic account එකේ credit නෑ"	Billing එකෙන් credits දාලා Sort with AI ආයෙත් ඔබන්න.
Create key button එක වැඩ කරන්නේ නෑ	Account එකේ ඒකට අවසර නෑ. Account එකේ admin ගෙන් ඉල්ලන්න.
Install කරන්න Mac එක ඉඩ දෙන්නේ නෑ	System Settings > Privacy & Security > **Open Anyway**.
Licence key එක වැඩ කරන්නේ නෑ	Key එක ලැබුණු විදිහටම තියෙනවද සහ internet තියෙනවද බලන්න. ඒත් බැරි නම් WhatsApp කරන්න.
Photos 'Unsorted' එකේ	Internet හෝ credit ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. Sort with AI ආයෙත් ඔබන්න.

Update කරන විදිහ

Selectora quit කරලා අලුත් **.pkg** එක install කරන්න. API key එක, activation එක, projects ඔක්කොම එහෙමම තියෙනවා.

අලුත් API key එකක් දාන විදිහ

Import screen එකේ API key කොටුවේ **වෙනස් කරන්න** ඔබන්න, නැත්නම් **Settings (Cmd + ,)** එකට යන්න. අලුත් key එක paste කරලා Save ඔබන්න.

දත්ත තියෙන තැන් සහ Uninstall

- Projects, thumbnails, API key, activation: `~/Library/Application Support/WeddingCull`
- Project file එක: photos තියෙන folder එකේ **Selectora Project** folder එකේ.
- Uninstall: පිටු 11 බලන්න. Original photos වලට අත තියන්නේ නෑ.

Support

VELQORA LABS: hello.velqoralabs@gmail.com

WINDOWS

Windows එකේ Install කරන විදිහ

Install කිරීම සහ යතුරු ටික විතරයි වෙනස්. අනිත් හැමදේම මේ guide එකේ තියෙන විදිහමයි.

ඕන කරන දේවල්

- Windows 10 හෝ Windows 11 (64-bit)
- Install කරන්න 500 MB විතර ඉඩ. Shoot එකකට thumbnails වලටත් තව ඉඩ ඕන.
- RAM 8 GB හෝ වැඩි එකක් හොඳයි. SSD එකකින් ගොඩක් ඉක්මන්.

Install කරන විදිහ

1. **Selectora-Windows-1.3.1.zip** එක මත right-click කරලා **Extract All** ඔබන්න. Zip එක ඇතුළේ ඉඳන් run කරන්න එපා.
2. **Selectora-Setup-1.3.1.exe** double-click කරන්න.
3. **"Windows protected your PC"** කියලා නිල් පාට window එකක් ආවොත් **More info** ඔබලා **Run anyway** ඔබන්න.
4. ඇහුවොත් **Only for me** තෝරලා **Next** ඔබන්න, ඊට පස්සේ **Install** ඔබන්න.
5. **Finish** ඔබන්න. Desktop එකේ සහ Start Menu එකේ **Selectora** icon එක හැදෙනවා.

> නිල් පාට window එක එන්නේ මේ software එකට Microsoft certificate එකක් නැති නිසා. Antivirus එකක් block කළොත් Selectora එක allow කරන්න.

Activate කරලා API key එක දාන්න

Activation සහ API key පියවර Mac එකේ වගේමයි (පියවර 2 සිට 6). Workspace එක **Default** තෝරන්න අමතක කරන්න එපා.

Mac එකට වඩා වෙනස් දේවල්

කරන දේ	Mac	Windows
Settings open කරන්න	Cmd + ,	Ctrl + ,
මකපු project එක යන්නේ	Trash	Recycle Bin
දත්ත තියෙන තැන	`~/Library/Application Support/WeddingCull`	`%APPDATA%\Selectora`

> **Windows reinstall කළොත්**
>
> අලුත් Mac එකේ ඒ licence key එකම දාන්න. Devices 2 පිරිලා නම් පරණ එක තෝරලා **Sign out** කරන්න.

UNINSTALL

Selectora අයින් කරන විදිහ

Original photos, save කරපු photos සහ photos folder එකේ තියෙන **Selectora Project** folder එකට කිසි දෙයක් වෙන්නේ නෑ.

Mac

1. **Applications** folder එකේ **Uninstall Selectora** double-click කරන්න. එතන නැත්නම් zip එකේ තියෙන **Uninstall Selectora** එක open කරන්න.
2. Mac එක block කළොත් System Settings > Privacy & Security > **Open Anyway** ඔබන්න.
3. **App එක විතරක්** හෝ **App එකයි දත්තයි** තෝරන්න.
4. Mac password එක ඉල්ලුවොත් දෙන්න. Selectora open වෙලා තිබ්බොත් ඒක තනියම save වෙලා වැහෙනවා.

තේරීම	Trash එකට යන දේ	ඉතුරු වෙන දේ
App එක විතරක්	Selectora සහ uninstaller එක	Projects, API key, activation. ආයෙත් install කළාම ඒවා එහෙමම තියෙනවා.
App එකයි දත්තයි	උඩ ඒවාට අමතරව projects, thumbnails, versions, API key, activation	Photos සහ Selectora Project folder එක

වැරදිලා අයින් කළොත් Trash එකෙන් **Put Back** කරන්න පුළුවන්. Trash එක empty කළාම ආයෙත් ගන්න බෑ.

Windows

මේ ක්‍රම තුනෙන් ඕන එකක් පාවිච්චි කරන්න:

1. **Start Menu:** Start ඔබලා **Uninstall Selectora** කියලා type කරලා open කරන්න.
2. **Settings:** Settings > Apps > Installed apps (Windows 10 එකේ Apps & features) > **Selectora** > Uninstall.
3. **Zip එකේ file එක: Uninstall Selectora.bat** double-click කරන්න.

Windows එකේ අයින් වෙන්නේ app එක විතරයි. Projects, API key සහ activation `%APPDATA%\Selectora` එකේ ඉතුරු වෙනවා.

> **Windows එකේ දත්තත් මකනවා නම්**
>
> Uninstall කරලා File Explorer එකේ address bar එකේ `%APPDATA%\Selectora` type කරලා Enter ඔබන්න. ඊට පස්සේ address bar එකෙන් එක folder එකක් උඩට ගිහින් **Selectora** folder එක delete කරන්න.

> **ආයෙත් පාවිච්චි කරනවා නම්**
>
> Activation key එකයි API key එකයි ළඟ තියාගන්න. දත්ත මැකුවොත් ඒ දෙකම ආයෙත් දාන්න ඕන.

ENGLISH

Quick guide

Selectora runs on Apple Silicon Macs (M1 or newer) with macOS 15 or newer, and on 64-bit Windows 10 or 11.

1. Install

Mac: Quit Selectora. Open the zip and double-click **Selectora-1.3.1.pkg**, then press **Continue** and **Install**. If macOS blocks it, go to System Settings > Privacy & Security and press **Open Anyway**.

Windows: Extract the zip and run **Selectora-Setup-1.3.1.exe**. If a blue window appears, press **More info** and **Run anyway**.

2. Activate

Open the app, enter your licence key and press **Activate**. One licence works on 2 devices. On a third device, you choose which one to sign out.

3. Create a Claude Console account

Go to platform.claude.com and create an account or sign in.

4. Buy credits

Go to platform.claude.com/settings/billing and press **Buy credits**. Credits expire one year after purchase and are non-refundable. You buy credits, not tokens. Tokens are how the AI's use is measured, and the cost comes out of your credits.

5. Create an API key

Go to platform.claude.com/settings/keys and press **Create key**. Name it `Selectora`, set Expiration to **Never**, set Linked account to yourself, and choose the **Default** workspace. Copy the key straight away, because it is shown only once.

> **The workspace is required**
> A key with no workspace saves normally, but AI sorting fails. If you see a workspace error in Selectora, create a new key with the Default workspace.

6. Add the key to Selectora

Press **Get started**, choose Facebook Upload or Album Creation, paste the key into the API key box and press **Save**. You can change it later in Settings (Cmd + , on a Mac, Ctrl + , on Windows).

7. Your first shoot

Drag in the photos folder. Choose Wedding (with its ceremony), Homecoming, Engagement, Pre-shoot (with outfits) or Celebration (Birthday, Maternity and more), give the number of photos and press **Start**. Selectora sorts the photos into the sections the shoot really has. Press + beside Album sections to add one, or open a section and press Hide or Delete. In the preview, the arrow keys follow the grid and the select key (Space, changeable) selects and deselects. The Family Album is its own screen with only family and guest group photos; the couple's numbers narrow it, and it saves on its own.

Update, uninstall and support

To update, install the new setup file. Your API key, activation and projects stay. To uninstall on a Mac, open **Uninstall Selectora** in Applications. On Windows, open **Uninstall Selectora** from the Start Menu. Your photos are not touched. Support: hello.velqoralabs@gmail.com